ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2017 සැප්තැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, September 2017

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලු සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කැළණි ගඟ අසබඩ අවන්හලක් පවත්වාගෙන ගිය ගංගනාත් විජයසූරිය ඔහුගේ ව්‍යාපාරය පසුගිය දා ඇති වු ගංවතුර හේතුවෙන් විනාශයට පත් විය. ගං වතුර බැස යාමෙන් පසු ජූනි මාසයේ ව්‍යාපාරයේ නමින් ඔහු කොළොන්නාව මහජන බැංකුවේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ 6% වාර්ෂික පොළියට රු. 400,000 ක ණය මුදලක් ලබා ගත්හ. ඔහු ලග ඉතිරිකර ගත් රු. 200,000 මුදල් ද යොදවමින් නැවත ඔහුගේ ව්‍යාපාරය නව මුහුණුවරකින් "ගංගනාත් අවන්හල" නමින් ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කරමින් සිටින අතර තුර දී දේශිය විදේශීය ආහාර වර්ග පිසිමේ පුහුණු පාඨමාලාවක් හදාරා ඇති ඔහුගේ මිතුරෙකු වු රංගනාත් සමරසේකර ද රු. 300,000 මුදලක් ව්‍යාපාරයට යොදවමින් එක් විය. දෙදෙනාම එකතුවීමෙන් පසු මෙම අවන්හල එම ප්‍රදේශයේ ම ඉඩ පහසුකම් සහිත මාසික කුලිය රු. 50,000කට, වෙනත් ස්ථානයක පිහිටි ගොඩනැගිල්ලකට ගෙන ගියහ. ආහාර පිසිම සඳහා රු. 90.000 උපකරණ ණයට ලබා ගන්නා ලදි. පසුව එම වර්ෂයේ ජූනි මස දැරු වියදම් සාරාංශයක් පහත දැක්වේ.

| | |
|---|---|
| අත්පිට ගැණුම් | රු. 340,000 |
| අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීම් (භාවිතය සඳහා) | රු. 120,000 |
| මාසික විදුලි බිල | රු. 15,000 |
| මාසික ගොඩනැගිලි කුලිය | රු. 50,000 |
| අත් උදව්කරුට ගෙවු මාසික වැටුප | රු. 40,000 |

- ❖ ආහාර පිසිම සඳහා ලබා ගත් උපකරණ වල ඵලදායි ජිවිත කාලය වසර 10 කි.
- ❖ ණය පොළිය, මාසික වාරිකය ගෙවන ලදි.

(i) අ. නව ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධානය කුමක් ද?
ආ. එම ව්‍යාපාර සංවිධානයේ වාසි හා අවසිය බැගින් ලියන්න.

(ii) අ. ගංගනාත් හා රංගනාත් ආරම්භ කළ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද?
ආ. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iii) නව ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් නම් කරන්න.

(iv) ගංගනාත් හා රංගනාත්ගේ ව්‍යාපාරයේ සඳහා බඳවා ගත හැකි උපරිම සංඛ්‍යාව කීය ද? ඒ බව සඳහන් කර ඇති පණත කුමක් ද?

(v) මෙම ව්‍යාපාරය පිළියෙල කල යුතු උපයෝගි පොත් 2ක් සඳහන් කරන්න.

(vi) මෙම ව්‍යාපාරයේ ජුනි 01 දිනට මුළු වත්කම් වල වටිනාකම කොපමණද ?

(vii) ලබා ගත් බැංකු ණය මුදල සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

(viii) මෙම ව්‍යාපාරයේ ජුනි 30 දිනට වගකීම් කියද ?

(ix) ලාභ අලාභ ප්‍රකාශණයේ දැක්විය යුතු මාසික උපකරණ ක්ෂය ප්‍රමාණය කීය ද?

(x) මෙම ව්‍යාපාරයේ ජුනි මාසයේ මුදල් ගිණුම සකස් කර මාසය අවසනයේ ශේෂය ගණනය කරන්න.

*ලකුණු 02 x 10 = 20 යි*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් ව්‍යාපාරික ශක්තියක් හා බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් තර්ජනයක් නම් කරන්න.

ii. අ. හවුල් ගිවිසුමක් ඇති කර ගත හැකි ක්‍රම මොනවාද ?

ආ. වංචා වැළැක්වීමේ ආඥා පනතේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ කුමක්ද?

iii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

- ❖ අවශ්‍යතා හා වුවමනා, ව්‍යාපාර බිහිවීමට ප්‍රධාන පදනම වී ඇත.
- ❖ අතිරික්තය සාමාජිකයින් අතර පෞද්ගලිකව බෙදීම සමුපකාර සමිතියක ලක්ෂණයක් නොවේ.
- ❖ ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයෙන් ලැබෙන තර්ජනයකි.
- ❖ දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම, ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර ලෙස බලපායි.

iv. අ. රාජ්‍ය සංස්ථා ආරම්භ කෙරෙන ක්‍රම මොනවා ද?

ආ. රාජ්‍ය සංස්ථා හඳුනා ගත හැකි තවත් නම් 4ක් ලියන්න. ලකුණු 08 යි

03. i. සිල්ලර වෙළෙඳ කටයුතුවල යෙදෙන්නා සිල්ලර වෙළෙන්දා වේ. සිල්ලර වෙළෙඳාම වැදගත් වීමට හේතු 2ක් සඳහන් කරන්න.

ii. දෙපාර්ශවයටම රක්ෂණ ගිවිසුමේ නීත්‍යානුකූල අයිතිය අවලංගු කිරීමේ අයිතිය හිමිවන රක්ෂණ මූලධර්මය කුමක් ද?

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ඉදිරියෙන් දක්වන්න.

- ❖ ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සම්පත්, තනතුරු හා වැඩ බෙදා දීමේ ක්‍රියාවලිය සංවිධානකරණය ලෙස හැඳින්වේ.
- ❖ ස්ථාවර තැන්පතු මුදල කොපමණ වුවද පොලී ප්‍රතිශතය ස්ථාවර ය.
- ❖ ක්‍රීඩා තරඟ, නාට්‍ය වැනි දෑ සඳහා අනුග්‍රහ දැක්වීම ව්‍යාපාර කටයුතු සඳහා කරන ප්‍රවර්ධන කාර්යය කි.
- ❖ විවිධ ප්‍රවාහන මාර්ග වල ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා යාන වාහන ප්‍රවාහන මාර්ගය ලෙස හැඳින්වේ.

iv. අ. අලෙවිකරණ මිශ්‍රය නම් කරන්න.

ආ. ව්‍යාපාරයට ආදායම් ගෙන දෙන එහි ඇති එකම විචල්‍ය කුමක් ද? ලකුණු 08 යි

## II කොටස - ගිණුම්කරණය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. අ. පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

i. අත්පිට විකුණුම් රු. 18,500

ii. උපචිත රක්ෂණ ගාස්තු රු. 2,500

iii. බොල් ණය රු. 4,000

iv. මෝටර් රථ ක්ෂය කිරීම රු. 13,800

v. ලැබියයුතු ගෙවල්කුලී රු. 10,000

vi. අයිතිකරු රු. 3,000ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා. *ලකුණු 06 යි*

ආ. පහත දැක්වෙන්නේ සාගරගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ ව්‍යාපාරය සකස් කරන ලද බැංකු ගිණුමේ හා එදින ලද බැංකු ප්‍රකාශණයේ සාරාංශයකි.

**බැංකු ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 11,500 | විහඟ (චෙක් අංක 1005) | 3,600 |
| චෙක් අංක 101 | 4,500 | නේත්‍රා (චෙක් අංක 1006) | 5,400 |
| චෙක් අංක 105 | 7,200 | දිමිත්‍රා (චෙක් අංක 1007) | 8,100 |
| චෙක් අංක 215 | 8,400 | මලිත්‍රා (චෙක් අංක 1008) | 2,500 |
| | | ශේෂය ප/ගෙ | 12,000 |
| | 31,600 | | 31.600 |

**බැංකු ප්‍රකාශණය**

| විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| ශේෂය | | | 11,500 |
| චෙක් අංක 105 | | 7,200 | 18,700 |
| චෙක් අංක 1006 | 5,400 | | 13,300 |
| චෙක් අංක 215 | | 8,400 | 21,700 |
| චෙක් අංක 1007 | 8,100 | | 13,600 |
| චෙක් අංක 1008 | 2,500 | | 11,100 |
| ලාභාංශ | | 1,200 | 12,300 |
| ගෙවල් කුලි | 7,500 | | 4,800 |
| සේනානි (චෙක්පත) | | 9,000 | 13,800 |
| චෙක්පොත් ගාස්තු | 2,000 | | 11,800 |
| බැංකු ගාස්තු | 1,500 | | 10,300 |

**ඔබ විසින්,**

1. 2017.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුම *ලකුණු 06 යි*

2 2017.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න *මුළු ලකුණු 12 යි*

05. අ. නිම්සරගේ ව්‍යාපාරයේ 2017.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 30,000 |
| ගැනුම් | 42,500 | |
| විකුණුම් | | 56,400 |
| මුදල් ශේෂය | 9,300 | |
| දුරකථන | 450 | |
| රක්ෂණය | 7,500 | |
| ණයහිමියෝ | | 9,600 |
| වැටුප් හා වේතන | 12,100 | |
| ණයගැතියෝ | 9,300 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 118,000 | |
| බැංකු ණය | | 110,000 |
| අවිනිශ්චිත ගිණුම | 6,850 | |
| | 206,000 | 206,000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් පසු පහත වැරදි ඇති බව සොයා ගන්නා ලදි.

1. රු. 4,500ක දුරකථන ගාස්තු ගෙවීම දුරකථන ගාස්තු ගිණුමේ රු. 450 ක් ලෙස සටහන් වීම
2. ගැනුම් ගිණුමට රු. 2,500 ක් වැඩියෙන් ද රක්ෂණ ගිණුමට රු. 2,500ක් අඩුවෙන් ද සටහන් වී ඇත.
3. ණයහිමියෙකු වූ චේතනාට ගෙවූ රු. 2,800 මුදල් පොතේ නිවැරදිව සටහන් කළද ඇයගේ ගිණුමේ සටහන් කර නොමැත.

**ඔබ විසින්,**

1. ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්
2. වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම ද පිළියෙල කරන්න. *ලකුණු 04 යි*

ආ. නතාෂාගේ ව්‍යාපාරයේ 2017.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ගැනුම් හා විකුණුම් | 182,000 | 198,500 |
| 2016.04.01 තොගය | 23,500 | |
| රක්ෂණය | 17,500 | |
| දුන් වට්ටම් | 4,600 | |
| 10% බැංකු ණය | | 80,000 |
| ආපසු එවුම් හා ආපසු යැවුම් | 8,500 | 7,000 |
| ලද වට්ටම් | | 22,000 |
| ගෙවූ ණය පොලී | 5,000 | |
| ගෙන යාමේ කුලී | 3,500 | |
| ප්‍රචාරණය | 11,500 | |
| විදුලිය | 9,200 | |
| ණයගැතියෝ හා ණයහිමියෝ | 47,500 | 36,000 |
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැයට) | 128,000 | |
| ලී බඩු (පිරිවැයට) | 62,000 | |
| ප්‍රාග්ධනය | | 143,000 |
| අතති මුදල් | 9,200 | |
| ක්ෂය වෙන්කිරීම් - ලී බඩු | | 31,000 |
| ගැනිලි | 5,500 | |
| | 517,500 | 517,500 |

පහත ලබා දී ඇති අමතර තොරතුරු ද සැලකිල්ලට ගෙන 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය ද එදිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය ද පිළියෙල කරන්න.

1. 2017.03.31 තොගය රු. 18,500
2. උපචිත රක්ෂණය රු. 2,500, ඉදිරියට ගෙවූ ප්‍රචාරණය රු. 1,500
3. ලී බඩු 10% ක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
4. ණයගැතියන්ගෙන් රු. 7,500ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.

*ලකුණු 08 යි*

*මුළු ලකුණු 12 යි*